**බුත්තල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 වැනි දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**
**---------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදල රු. 144,340 ක් වුවද එය රු. 110,000 ක් ලෙස රු. 34,340 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායම් රු. 273,000 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂය අවසානයට රු. 277,103,991 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, පිළිගත් හා අදාල වෘත්තිය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කර නොතිබුණි.

(ඈ) සභාව සතු ගිණුම් ගත නොකල ඉඩම් කැබලි 26 ක් පිළිගත් හා අදාල වෘත්තිය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කර නොතිබුණි.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 -2015 වර්ෂය දක්වා ඉදිරියට එමින් පවතින බදු දේපල 6 කට අදාල බදු කුලී රු. 1,732,025 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂයන්වල මෝටර් ග්‍රේඩරය, මාර්ග තලනය, බැකෝ ලෝඩරය, හා ටිපර් රථය කුලියට දීමෙන් සභාවට අයවිය යුතු රු. 3,498,234 ක මුදල අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නව කඩ කාමර ඉදි කිරීමේදී ඉවත් කළ පැරණි කඩ කාමර හිමියන්ගෙන් අයකර ගත යුතු රු. 162,183 ක හිඟ කඩ කාමර කුලී සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි'

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින සභාවට අයවිය යුතු රු. 165,950 ක සේවක ණය ශේෂයක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු. 144,340 ක හිඟ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුලදී ද ක්‍රියාකර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 401,765,888 ක වත්කම් විෂයන් 03 ක් සහ රු. 5,382,127 ක වගකීම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකි විය.

**1.3.4 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------

ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යාතුමාගේ අංක 1816/43 හා 2013 ජුනි 28 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා 23 ක් ජංගම (සංචාරක) වෙළඳාම පාලනය කිරීමට අදාල වන 23 වන අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනිමටද කටයුතු කර නොතිබු අතර සභාව විසින් අනවසර වෙළෙඳ සැල් හා ජංගම වෙළඳාම අධික්ෂණය කිරිම, පාලනය කිරිම හා එම කාර්යය සඳහා බල පත්‍රයක් නිකුත් කිරිම, විධිමත් කිරිම, තහනම් කිරිමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,080,441ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 1,094,873 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 5,985,568 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

--------------------

#### 2.2.1 හිඟ ආදායම්

---------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තියේ විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 10,062,116 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 වරිපනම් බදු

---------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරිපනම් බදු අය කිරිමට අදාල දේපල වසර 5 කට වරක් තක්සේරු කළ යුතු වුවත් සභාව විසින් 2006 වර්ෂයෙන් පසු වරිපනම් බදු සඳහා දේපල තක්සේරු කිරිමක් සිදුකර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ වරිපනම් බදු බිල් කල වටිනාකම රු. 2,020,488 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට අයකර තිබු බදු මුදල රු. 949,201 කි. එය මුළු බිල් කල වටිනාකමින් සියයට 46 ක් වැනි අඩු ප්‍රතිශතයකි.

(ඇ) 2015 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ආදායම රු. 5,244,549 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු ලෙස රැස්කර තිබුණේ රු. 2,243,950 කි. එය සියයට 42 ක් වැනි අඩු පුතිශතයක් විය. ඒ අනුව වරිපනම් බදු අය කිරිමේ ප්‍රතිශතය සියයට 50 ක අඩු මට්ටමක් පැවතුණි.

#### 2.2.3 බදු කුලී

---------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු එළු මස් කඩය 2012 වර්ෂයේදී රු. 22,000 ක මුදලකටද, ගවමස් කඩය 2013 වර්ෂයේදී රු. 1,526,265 ක මුදලකටද, අවසන් වරට ටෙන්ඩර් මඟින් බදු දී තිබුණි. මෙම දේපල බදුදිම සඳහා මිල ගණන් කැඳවා තිබුණද, බදුකරුවන් ඉදිරිපත් නොවිම නිසා 2015 වර්ෂය දක්වාම බදු දීමට නොහැකිවී තිබුණි. මේ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බලා දේපල බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට සභාව සතු බදු දේපල 6 කින් 1989 – 2015 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු හිඟ බදු මුදල රු. 1,732,025 කි.

(ඇ) සභාව සතු බදු දී ඇති කඩ කාමර 121 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 265,425 ක මුදලක් අයවීමට තිබුණි.

**2.2.4 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

**-----------------------------**

සභා බල ප්‍රදේශයේ විවිධ දුරකථන සමාගම් විසින් 2008 සිට 2013 වර්ෂය දක්වා ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 15 කින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික බද්දක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**---------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.723,701 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.309,570 ක් අයවිය යුතුව තිබුණි.

**2.3 අධිභාර**

**--------**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.733,241 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2 (1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරිම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන, වීථි පහන් ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරිම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 173,666 ක වියදමක් දරා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 නියමය අනුව රු. 651,853 ක් වටිනා තැන්පතු නියාදනය කිරිමට කටයුතු කර නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පාලනය

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ PFD/PMD/clari/11/02 හා 2011 සැප්තැම්බර් 27දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 452 හි 3.1 වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ඉහත චක්‍රලේඛයෙහිම 3.2 හි වගන්තියේ සඳහන් ලිපි ලේඛන පරීක්ෂා කර ප්‍රජාපාදක සංවිධානවලට කොන්ත්‍රාත් පැවරීම සිදුකළ යුතු වුවත් කර්මාන්ත ඉදිකිරීම් 08 ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබු අතර ඉහත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි අංක 703 (1) (ආ) පටහැනිව උප කොන්ත්‍රාත් දීමද සිදුකර තිබුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කළ යුතු දිනට වැඩ අවසන් නොකල කර්මාන්ත 2ක් වෙනුවෙන් අය කළ යුතු ප්‍රමාද ගාස්තු රු. 37,630 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ ආදේශක, සෞඛ්‍ය කම්කරුවකු බඳවාගෙන, බඳවාගත් දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු. 334,354 ක වැටුප්, දීමනා, සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 71 හා 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සභාවේ අනියම් හා ආදේශක පදනම මත සේවය කළ යන්ත්‍ර ක්‍රියාකරු, මුරකරු, ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු හා යන්ත්‍ර ක්‍රියාකරු සහායක යන තනතුරු සඳහා සේවකයින් 35 දෙනෙක් අනුමත කාර්යය මණ්ඩලයට පිටින් ස්ථිර සේවයට පත් කර තිබුණි.

(ඇ) තනතුරු 7 කට අදාලව අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 36 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

--------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්,වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3** **අභ්‍යන්තර විගණනය**

---------------------------

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.4** **විගණන හා කළමනාකරණ කමිටු**

**----------------------------------**

2009 ජුනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි

**5.** **පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත් පාලනය